# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## උකස් (සංශෝධන)

**(89 වන අධිකාරය වූ) උකස් පනත සංශෝධනය කිරීම සඳහා වූ
පනත් කෙටුම්පතකි**

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 ජනවාරි මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 නොවැම්බර් මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[229 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** ඃ මෙම වගන්තිය මගින් (89 වන අධිකාරය වූ) උකස් පනතට 68අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2023 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව උකස් පනතේ III වන කොටස චංචල දේපළ සම්බන්ධයෙන් අදාළ වීම සීමා කිරීම වේ.

**උකස් (සංශෝධන)**

එල්.ඩී.-ඕ. 65/2017

**(89 වන අධිකාරය වූ) උකස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2024 අංක  දරන උකස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

89 වන අධිකාරයට 68අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**2.** (89 වන අධිකාරය වූ) උකස් පනතේ 68 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 68අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :-

"III වන කොටස චංචල දේපළවලට අදාළ වීම

**68අ.** මේ පනතේ III වන කොටසේ විධිවිධාන, 2023 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව එම සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට පමණක් චංචල දේපළ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී